# ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය


**වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව**

**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය**

**ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය**



**2025**

පටුන

පූර්විකාව....................................................................................................................2

1.0 වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව .........................................3

2.0 දැක්ම.........................................................................................................................4

3.0 මෙහෙවර....................................................................................................................4

4.0 මූලික සිද්ධාන්ත.........................................................................................................4

5.0 ප්‍රතිපත්තිමය අරමුණු...................................................................................................6

6.0 ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර................................................................................................7

6.1 වැඩිහිටි අයිතිවාසිකම් සහ සුරක්ෂිතතාව .................................................................7

6.2 සෞඛ්‍යය සහ යහපැවැත්ම ......................................................................................8

6.3 මූල්‍ය සුරක්ෂිතතාව ................................................................................................9

6.4 සමාජ ආරක්ෂණය, සහභාගීත්වය සහ අන්තර්කරණය ...............................................10

6.5 දිගුකාලීන සත්කාර සහ සහායක සේවා.....................................................................11

6.6 වැඩිහිටි හිතකාමී පරිසර .......................................................................................12

6.7 හදිසි අවස්ථා සූදානම............................................................................................12

6.8 ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය.................................................................................13

6.9 අධීක්ෂණය සහ ඇගයීම..........................................................................................14

6.10 උපදේශනය, දැනුවත් කිරීම සහ සන්නිවේදනය ......................................................14

# පූර්විකාව

ශ්‍රී ලංකාව, ජන සංඛ්‍යාව වියපත් වීමේ සීඝ්‍ර වර්ධන ප්‍රවණතාව ඔස්සේ ගැඹුරු ජනවිකාසන පරිවර්තනයකට මුහුණ දෙමින් සිටියි. වියපත් වීම යනු, නො නවතින ජෛව ක්‍රියාවලියක් වන අතර, එමගින් වියපත් වූවන්ගේ කායික, මානසික සහ සමාජීය වෙනස් වීම් ඇති වේ. වයස අවුරුදු 60 ඉක්ම වූ ඕනෑම පුද්ගලයෙකු වැඩිහිටි තැනැත්තෙකු ලෙස අර්ථ දැක්වෙන අතර, පවුල, ප්‍රජාව සහ ජාතික සංවර්ධනය සඳහා වැඩිහිටියන්ගේ අමිල දායකත්වය හඳුනා ගනිමින්, ඔවුනගේ අයිතිවාසිකම්, අභිමානය සහ යහ පැවැත්මෙහි සුරක්ෂිතතාව සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. වැඩිහිටියන් සඳහා වූ මැඩ්රිඩ් ජාත්‍යන්තර ක්‍රියාකාරී සැලැස්ම (2002), එක්සත් ජාතීන් විසින් නම් කරන ලද සුවබර වැඩිහිටි දිවියක් සඳහා වූ දශකය (2021-2030) සහ ශ්‍රී ලංකාවේ 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ එහි සංශෝධන යනාදී නෛතික ආකෘති මෙම ප්‍රතිපත්තිය සැකසීමේ දී දායක කරගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය මගින් වැඩිහිටියන් සඳහා සමාජ අන්තර්කරණය, සහයෝගය සහ වැඩිහිටි හිතකර සමාජයක් ගොඩනැගීම පිළිබඳ ශ්‍රී ලංකා රජයේ කැප වීම අවධාරණය කෙරේ. වැඩිහිටි තැනැත්තන්ගේ බහුවිධ අවශ්‍යතා සපුරාලීම, සෞඛ්‍ය සම්පන්න සහ ක්‍රියාශීලී වයස් ගත වීම ප්‍රවර්ධනය කිරීම සහ අන්තර් - පරම්පරානුගත සහයෝගිතාව වැඩිදියුණු කිරීම සඳහා මෙම ප්‍රතිපත්තිය තුළින් පුළුල් පදනමක් සකසනු ලැබේ. සම්බන්ධීකරණය කරන වූ, සාක්ෂි මත පදනම් වූ සහ අයිතිවාසිකම් කේන්ද්‍ර කර ගත් ප්‍රවේශයන් ඔස්සේ, වැඩිහිටි තැනැත්තන්ගේ ස්වාධීනත්වය, ආරක්ෂාව සහ අභිමානයෙන් යුතු ව ජීවත් වීමට ඇති අයිතිය සවිබල ගැන්වීම මෙම ප්‍රතිපත්තියේ අරමුණ වේ.

මෙම ප්‍රතිපත්තිය බල ගැන්වීම මගින් ශ්‍රී ලංකාවේ සියලුම පරම්පරාවනට අන්‍යොන්‍ය ගරුත්වයෙන් හා වගකීමෙන් යුක්ත ව ජීවත්විය හැකි තිරසර අනාගතයක් බිහිකරලීමට ප්‍රතිඥා දෙයි.

## 1.0 වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව

සීඝ්‍රයෙන් වර්ධනය වන වැඩිහිටි ජනගහනය හමුවේ මතුවන සංකීර්ණ අභියෝගයන්ට මුහුණ දීම උදෙසා ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ පූර්ණ ජාතික ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍ය වේ. දකුණු ආසියාවේ වේගයෙන් ම ජනගහනය වියපත් වෙමින් පවතින රටක් ලෙස, ශ්‍රී ලංකාව සැලකිය යුතු ජන විකාසන සංක්‍රාන්තියකට භාජනය වෙමින් පවතින අතර, එය පහත වැටෙන සාඵල්‍යතා අනුපාතික සහ වර්ධනය වන ආයු අපේක්ෂාව මගින් සංලක්ෂිත ය. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (2012: 2024*) අනුව, වයස අවුරුදු 60 සහ ඊට වැඩි ජන සංඛ්‍යාව 1981 වර්ෂයේ සියයට 6.6 ක සිට 2012 වර්ෂයේ සියයට 12.4 දක්වා දෙගුණ වූ අතර, 2024 දී සියයට 18 ක් ලෙස වාර්තා විය.

මෙම ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය තුළින් සෞඛ්‍ය, සමාජීය සහ ආර්ථික ක්ෂේත්‍ර ඔස්සේ දැඩි බලපෑම් ඇති විය හැකි ය. වැඩිහිටි යැපුම් අනුපාතය ක්‍රමික ව ඉහළ යමින් පවත්නා අතර, සාම්ප්‍රදායික පවුල පාදක ආධාරක පද්ධති සහ රජය විසින් පවත්වා ගෙන යනු ලබන වැඩිහිටි සේවා යන දෙයංශයටම මෙමගින් ඇති කරනු ලබන පීඩනය අතිමහත් ය. ශ්‍රම බලකායට අයත් පිරිස්වල ඉහළ යන විදෙස් සංක්‍රමණ ප්‍රවණතා තුළින්, වැඩිහිටි තැනැත්තන් සඳහා අනාදිමත් කාලයක් ඔස්සේ සහාය වූ විස්තෘත පවුල ආශ්‍රිත සම්බන්ධතා තවදුරටත් දුර්වල වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බොහෝ වැඩිහිටි තැනැත්තන් සීමිත වැඩිහිටි සත්කාර සහ සමාජ සම්බන්ධතා සමඟ මඟ හැරීමකට ලක් ව ඇත. තව ද, වැඩිහිටි ජන සංඛ්‍යාවෙහි වැඩිහිටි කාන්තාවන් බහුල වීම තුළ, වියපත් වීම ස්ත්‍රීකරණයට ලක්වීම හේතුකොට ගෙන, මෙම තත්ත්වය වඩාත් සංකීර්ණ වී ඇත. දිගු ආයු අපේක්ෂාව, අවම ආදායම් උත්පාදනය, මූල්‍ය ආරක්ෂාව සඳහා වන සීමිත ප්‍රවේශය යන කරුණු හේතුකොට ගෙන වැඩිහිටි කාන්තාවන් දරිද්‍රතාව, සමාජ හුදකලා බව සහ සෞඛ්‍ය ආශ්‍රිත අභියෝගවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇත.

වියපත් වීම ස්වභාවික ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක් වුව ද, එහි සමාජීය, සෞඛ්‍යමය හා ආර්ථික ප්‍රතිවිපාක සඳහා කඩිනම් සහ ප්‍රගතිගාමී ප්‍රතිපත්තිමය ප්‍රතිචාර අවශ්‍ය කෙරේ. ප්‍රමාණවත් සැලසුම්කරණයකින් තොර වීම, වැඩිහිටි විය ආශ්‍රිත සෞඛ්‍ය ගැටළු වර්ධනය වීම, මූල්‍ය අනාරක්ෂිත බව සහ සමාජමය බැහැර වීම පිළිබඳ අවදානම මගින් ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන්ගේ යහපැවැත්ම සැලකිය යුතු ලෙස අභියෝගයට ලක් වී ඇත. තව ද, පවත්නා විශ්‍රාම වැටුප් ක්‍රමවේදයන් හි තිරසර බව ද ගැටළුකාරී වන අතර, එය සමාජ ආරක්ෂණයට සහ ජාතික ස්ථාවරත්වයට තවදුරටත් අභියෝග එල්ල කරයි.

ජනගහනය වියපත් වීම ක්‍රමෝපායිකව වැදගත් අවස්ථා උදාකරයි. වැඩිහිටි තැනැත්තන්, රැකවරණ සැපයීම, ස්වේච්ඡා කටයුතු සහ ප්‍රජාපාදක සහභාගිත්වය තුළින් පමණක් නො ව, නවෝත්පාදන සහාය, ඥාණෝපදේශය මෙන්ම ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය සඳහා ශ්‍රම බලකාය සවිබලකරණය වෙනුවෙන් අවශ්‍ය වන දැනුම, කුසලතා සහ ජීවන අත්දැකීම් සැපයීම තුළින් සමාජයට සක්‍රිය දායකත්වයක් ලබාදෙයි. වැඩිහිටි හිතකාමී පරිසරයක් තුළ වැඩිහිටි ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් සාම්ප්‍රදායික විශ්‍රාම වයස ඉක්මවා ආර්ථිකමය වශයෙන් ඵලදායී ජීවිත ගත කරනු ලැබේ.

වැඩිහිටි තැනැත්තන් සඳහා මනාව සැකසූ ජාතික ප්‍රතිපත්තියක් තුළින් මෙම බහුවිධ අභියෝග විසඳීම සඳහා තීරණාත්මක පදනමක් සැපයිය හැකි ය. එමගින් ක්‍රියාශීලී සහ සෞඛ්‍ය සම්පන්න වයස්ගත වීමක් ප්‍රවර්ධනය කළ යුතු ය. මෙම ප්‍රතිපත්තිය මගින් ක්‍රියාකාරී හා සෞඛ්‍යමත් වියපත්භාවයක් ප්‍රවර්ධනය කිරීම, ගුණාත්මක වැඩිහිටි සත්කාර සේවා සඳහා සාධාරණ ප්‍රවේශ සහතික කිරීම සහ විශ්‍රාම වැටුප් සහ ප්‍රජා පාදක සේවා ඇතුළු සමාජ ආරක්ෂණ පද්ධති ශක්තිමත් කිරීම සිදු කළ යුතු වේ. එසේ ම, වැඩිහිටි තැනැත්තන්ගේ හැකියාවන් හා සමාජ සහභාගීත්වය ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය සඳහා අගනා සම්පත් ලෙස හඳුනා ගැනීම සහ ශක්තිමත් කිරීම මෙම ප්‍රතිපත්තිය මගින් සිදු කළ යුතු ය. තව ද, වඩාත් නම්‍යශීලී රැකියා අවස්ථා, කුසලතා වර්ධන වැඩසටහන් හා ස්වේච්ඡා සේවා සඳහා වන අවස්ථා හරහා වැඩිහිටි තැනැත්තන්ට ඵලදායී ව හා සමාජීය ව දායක වීමට මෙම ප්‍රතිපත්තිය තුළින් අවස්ථා ලබා දිය යුතු ය.

විශේෂයෙන් ම, තරුණ සහ වැඩිහිටි පරම්පරාවන් අතර අන්‍යෝන්‍ය ගෞරවය සහ සහයෝගය පෝෂණය කරමින්, පරම්පරා අතර සාධාරණත්වය සුරක්ෂිත කිරීම සඳහා මෙවැනි ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍ය බව

පෙන්වා දිය හැකි ය. උපාය මාර්ගික සැලසුම්කරණය මගින්, සෞඛ්‍ය සේවා සහ වැඩිහිටි සත්කාර සේවා ආශ්‍රිත ව පැන නැගෙන අවස්ථා ප්‍රයෝජනයට ගෙන ජන සංඛ්‍යාව වියපත් වීම හේතුකොට ගෙන ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවට හැකියාව පවතී. මේ අනුව, වැඩිහිටියන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය හුදෙක් වැඩිහිටි රැකවරණය පිළිබඳ ප්‍රවේශයක් පමණක් නො ව, ශ්‍රී ලංකාවේ සමාජ සහජීවනය, ආර්ථික තිරසරභාවය සහ දිගු කාලීන ජාතික යහ පැවැත්ම ආරක්ෂා කිරීම සඳහා වන උපාය මාර්ගික සැලසුමකි.

** යාවකාලික*

## 2.0 දැක්ම

ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් හට සෞඛ්‍ය, රැකවරණය, මූල්‍යමය සහ සමාජ ආරක්ෂණය සඳහා සාධාරණ ප්‍රවේශ සැපයෙන අතර, ඔවුනට, පවුල සහ ප්‍රජාව තුළ අර්ථවත් ලෙස සහභාගිත්ව අවස්ථා හිමිවන පරිදි, අභිමානයෙන් යුතු ව, ස්වාධීන ව සහ ආරක්ෂිත ව ජීවත් වීම තහවුරු කිරීම.

## 3.0 මෙහෙවර

(අ) වැඩිහිටි තැනැත්තන් හට ක්‍රියාකාරී, අභිමානවත් ජීවිත ගත කරමින් සිය පවුලට සහ ප්‍රජාවට අර්ථවත් ලෙස දායක විය හැකි පරිදි, ඔවුනගේ සෞඛ්‍ය, ආරක්ෂාව, රැකවරණය සහ සහභාගිත්වය තහවුරු වන අන්තර්කරණය වූ සහ අයිතිවාසිකම් පාදක ක්‍රමවේද ස්ථාපිත කිරීම.

(ආ) සෞඛ්‍ය සම්පන්න ජීවන රටා, මූල්‍ය ආරක්ෂාව සහ වියපත් වීම පිළිබඳ ධනාත්මක ජීවන ප්‍රගමන ප්‍රවේශය ප්‍රවර්ධනය කරමින්, ස්ත්‍රී පුරුෂ බව හෝ සමාජ පසුබිම නො තකා වියපත් වීම කෙරෙහි ආත්ම විශ්වාසයකින් යුතු ව සූදානම් වීම සඳහා සියලු වැඩිහිටි තැනැත්තන් බලාත්මක කිරීම.

## 4.0 මූලික සිද්ධාන්ත

වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම්, අභිමානය සහ යහ පැවැත්ම නගා සිටුවීමෙහිලා ශ්‍රී ලංකාවේ කැපවීම පිලිබිඹු කෙරෙන මූලික සිද්ධාන්ත කීපයක් මත මෙම ජාතික ප්‍රතිපත්තිය ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම පදනම් වෙයි. වියපත් ජන සංඛ්‍යාව සඳහා අන්තර්කරණය වූ, සාධාරණ සහ තිරසර ප්‍රතිචාර සැපයෙන අන්දමින්, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සැලසුම් කිරීමේදී අවශ්‍ය ආචාර ධර්ම හා ක්‍රමෝපායික පදනම මෙම මූලික සිද්ධාන්ත තුළින් සැපයේ.

වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් ඵලදායි හා අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රතිපත්ති නිර්මාණය කිරීම උදෙසා පාදක වන මාර්ගෝපදේශ සපයනු ලබන, වියපත් වූවන් සඳහා එක්සත් ජාතීන් විසින් නම් කරන ලද මූලධර්ම, වියපත්වීම පිළිබඳ මැඩ්රිඩ් ජාත්‍යන්තර ක්‍රියාකාරී සැලැස්ම සහ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ යෝජිත සම්මුතිය යන ප්‍රධාන ජාත්‍යන්තර ආකෘති සමග මෙම සිද්ධාන්ත සමගාමී වේ. මෙම ගෝලීය කැපවීම් තුළින් වැඩිහිටි තැනැත්තන්ගේ ස්වාධීනත්වය, රැකවරණය, සහභාගිත්වය, ආත්ම තෘප්තිය සහ අභිමානය අවධාරණය කෙරේ.

මෙම ප්‍රතිපත්තිය සැකසීමේදී ඉහත කී මූලික සිද්ධාන්තයනට අනුගතවීමෙන් අරමුණු කෙරෙනුයේ ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් හට සිය පවුලට, ප්‍රජාවට මෙන් ම ජාතික සංවර්ධනයට ද අර්ථවත් ලෙසින් දායකත්වය සපයමින් සුරක්ෂිත, අභිමානවත් සහ ආත්ම තෘප්තියෙන් යුතු ජීවිත ගත කිරීම සඳහා උචිත පරිසරයක් නිර්මාණය කිරීම සාක්ෂාත් කර දීමයි.

01. **මානව හිමිකම් සහ අභිමානය**

සම සැලකුම් සහ අවස්ථා සහතික කරනු වස්, වයස පදනම් වූ සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම් පිටුදැකීම, ජාතික නීති සහ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වන ස්වාධිකාරය, සුරක්ෂාව සහ අර්ථවත් සහභාගීත්වය තුළින්, සමාජයේ සමානාත්මතාව හිමි ගෞරවනීය සාමාජිකයින් ලෙස ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් පිළිගැනීම.

02. **ජීවන ප්‍රගමන දෘෂ්ටිකෝණය සහ අන්තර්පරම්පරානුගත සහයෝගීතාව**

පුළුල් මානව ජීවන චක්‍රයේ එක් කොටසක් ලෙසින් වියපත් භාවය පිළිබඳ සාමස්ථික අවබෝධය ප්‍රවර්ධනය කිරීම සහ පරම්පරා අතර අන්‍යෝන්‍ය ගරුත්වය, සහයෝගීතාව සහ වගකීම ප්‍රවර්ධනය කිරීම.

03. **සාධාරණත්වය, අන්තර්කරණය සහ විවිධත්වය ගරු කිරීම**

වැඩිහිටි තැනැත්තන්ගේ ස්ත්‍රී පුරුෂ බව, පදිංචිය, හැකියාව, වාර්ගිකත්වය හෝ සමාජ ආර්ථික තත්ත්වය නො තකා අවස්ථා හා සේවා සඳහා සමාන ප්‍රවේශ සාක්ෂාත් කිරීම මෙන් ම වියපත් ජනගහනයේ සංස්කෘතික, ආගමික, භාෂාමය සහ පුද්ගල විවිධතාවලට ගරු කිරීම.

04. **අවදානම් සහිත ජන කණ්ඩායම්වල සුරක්ෂාව, බලගැන්වීම සහ ස්වාධිකාරය**

වැඩිහිටි කාන්තාවන්, ආබාධ සහිත පුද්ගලයන්, පවුලේ රැකවරණය නො ලබන පුද්ගලයන් සහ උග්‍ර දරිද්‍රතාවෙන් පෙළෙන්නන් ඇතුළත් ව, බහුවිධ වරප්‍රසාද අහිමි වූ වැඩිහිටි තැනැත්තන්ගේ සුරක්ෂාව සහ බලගැන්වීම උදෙසා ප්‍රමුඛතා සැපයීම. වැඩිහිටි තැනැත්තන් හට සිය ජීවිතය පිළිබඳ ව අවබෝධයෙන් යුතු තීරණ ගැනීම සඳහා වන ස්වාධිකාරී සහ ස්වයං නිර්ණ හැකියාවට මෙම ප්‍රතිපත්තිය මගින් සහාය සැපයීම.

05. **ක්‍රියාකාරී සහභාගීත්වය**

සමාජීය, ආර්ථික, සංස්කෘතික සහ සිවිල් ජීවන තත්ත්වයන් තුළ වැඩිහිටි තැනැත්තන්ගේ අඛණ්ඩ සහභාගීත්වය අගය කිරීම හා පහසුකම් සැලසීම. ප්‍රතිපත්ති සංවර්ධන, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලීන්හි වැඩිහිටි තැනැත්තන්ගේ හඬ සක්‍රීය ව දායක කර ගැනීම.

06. **තිරසරබව, සම්බන්ධීකරණය සහ අන්‍යෝන්‍ය වගකීම**

රාජ්‍ය අංශය, සිවිල් ප්‍රජාව, පවුල සහ පෞද්ගලික අංශය ඒකාබද්ධ ලෙස සම්බන්ධීකරණය වූ තිරසර සහ ප්‍රජා පාදක රැකවරණ ආකෘති ප්‍රවර්ධනය කිරීම. කාලානුරූපී ප්‍රජා විද්‍යාත්මක හා සමාජීය වෙනස් වීම්වලට අනුගත විය හැකි පරිදි මෙම ප්‍රතිපත්ති පවත්වා ගැනීම.

07. **ප්‍රවේශ්‍යතාව සහ සාමස්ථික සහාය**

සේවා, පහසුකම්, වටපිටාව සහ තොරතුරු, භෞතික ව, ආර්ථික ව සහ සමාජීය ව ප්‍රවේශ විය හැකි ලෙස ආබාධ සහිත වැඩිහිටි තැනැත්තන් ඇතුළු සියලු වැඩිහිටි තැනැත්තන් සඳහා සැපයෙන බවට සහතික වීම. සාමස්ථික ප්‍රවේශයක් තුළ සෞඛ්‍යය, රැකවරණය පමණක් නො ව සමාජ අන්තර්කරණය, චිත්තවේගී යහ පැවැත්ම සහ මූල්‍ය සුරක්ෂිතතාව කෙරෙහි ද අවධානය යොමු කිරීම.

08. **සාක්ෂි මත පදනම් වූ සහ ප්‍රතිචාරාත්මක ප්‍රතිපත්තිය**

පවත්නා යථාර්ථයන්ට ප්‍රතිචාර දැක්විය හැකි ආකාරයටත්, අනාගත අභියෝග හරහා අනුගත වීමට හැකි ආකාරයටත්, විශ්වසනීය දත්ත, පර්යේෂණ සහ සුදුසු ක්‍රියාපටිපාටි භාවිතා කරමින් තීරණ ගැනීම හා ප්‍රතිපත්ති සම්පාදනය.

## 5.0 ප්‍රතිපත්තිමය අරමුණු

වැඩිහිටි තැනැත්තන්ගේ අභිමානය, අයිතිවාසිකම් සහ යහපැවැත්ම ආරක්ෂා කිරීමෙහිලා ශ්‍රී ලංකා රජයේ කැපවීම වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියෙන් පෙන්නුම් කෙරේ. ජාතික සංවර්ධන ඉලක්ක මෙන් ම, ඊට අනුශාංගික ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන්ට සමගාමී ව, ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ මතුවන අවශ්‍යතාවලට පිළිතුරු සැපයීම උදෙසා මෙම ප්‍රතිපත්තිය මගින් සාමස්ථික, ජීවන ප්‍රගමන සහ අයිතිවාසිකම් පාදක ප්‍රවේශයක් අනුගමනය කෙරේ.

පහත දැක්වෙන ප්‍රතිපත්තිමය අරමුණු සකසා ඇත්තේ අදාළ උපාය මාර්ග සඳහා පැහැදිලි මග පෙන්වීම ලබාදීම, පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය පහසු කරවීම, ඵලදායි අධීක්ෂණය සහ ඇගයුම සඳහා ය.

1. **වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම**

   එක්සත් ජාතීන්ගේ වැඩිහිටි තැනැත්තන් පිළිබඳ සිද්ධාන්ත සහ වියපත් වීම පිළිබඳ මැඩ්රිඩ් ජාත්‍යන්තර ක්‍රියාකාරී සැලැස්ම යනාදී ජාත්‍යන්තර කැපවීම් සහ දේශීය නීති මගින් වැඩිහිටි තැනැත්තන් සඳහා සමාන අයිතිවාසිකම් සහ වෙනස් කොට සැලකීමෙන් වැළකෙන ක්‍රියාමාර්ග තහවුරු කිරීම.

2. **වැඩිහිටි  හිතකාමී සහ ප්‍රවේශ්‍යතා පහසුකම් සහිත පරිසරයක් ප්‍රවර්ධනය කිරීම**

   වැඩිහිටි තැනැත්තන්ට ආරක්ෂිත ව, ස්වාධීන ව සහ අභිමානවත් ව ජීවත් වීමට හැකි වන පරිදි, වැඩිහිටි හිතකාමී යටිතල පහසුකම්, නිවාස සහ ප්‍රවාහනය ඇතුළත් භෞතික හා සමාජීය පරිසර සංවර්ධනය කිරීම.

3. **සෞඛ්‍ය රැකවරණ සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම**

   සෞඛ්‍යය ප්‍රවර්ධනය, රෝග නිවාරණය, වයෝවෘද්ධ සත්කාර සේවා, මානසික සෞඛ්‍ය සේවා, දිවිනිමා සත්කාර සේවා, සහන සත්කාර සේවා සහ පුනරුත්ථාපන සහාය වැනි සේවා ඇතුළත් ව, වැඩිහිටි තැනැත්තන් සඳහා අංග සම්පූර්ණ, සහනදායී හා ගුණාත්මක සෞඛ්‍ය සේවා ලබා ගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම.

4. **ආර්ථික සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සඳහා සහාය වීම**

   ශ්‍රම බලකායේ අඛණ්ඩ රැඳී සිටීම හෝ විකල්ප ජීවනෝපාය සඳහා අවස්ථා සැපයීම මෙන්ම, තිරසර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ශක්තිමත් කිරීම තුළින් වැඩිහිටි තැනැත්තන්ගේ ආදායම් සුරක්ෂිතතාව සහතික කිරීම.

5. **සමාජ අන්තර්කරණය සහ සහභාගීත්වය සහතික කිරීම**

   හුදෙකලා බව සහ අන්තර් පරම්පරානුගත සහයෝගීතාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින්, සිය පවුල, ප්‍රජාව, සංස්කෘතිය, වටපිටාව සහ සිවිල් ජීවිත තුළ වැඩිහිටි තැනැත්තන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

6. **දිගු කාලීන, අතරමැදි, සහන සහ විවේක සත්කාර සේවා ශක්තිමත් කිරීම**

   ප්‍රජා පාදක, ආයතනික සහ නිවාස පාදක සේවාවන් ඇතුළු ව, විධිමත් සහ අවිධිමත් යන දෙයාකාරයේ ම සත්කාර පද්ධති පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම, රැකබලා ගන්නන් සඳහා අවශ්‍ය සහාය වැඩිදියුණු කිරීම සහ සහකම්පනයෙන් යුතු අතරමැදි, දිගු කාලීන සහ විවේක සත්කාර සඳහා ප්‍රවේශ සහතික කිරීම.

7. **ජීවන ප්‍රගමන ප්‍රවේශය තුළින් සම්බන්ධීකරණය හා ඒකාබද්ධතාවය වර්ධනය කිරීම**

සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත වියපත් බවක් සඳහා සූදානම සහතික කරන ජීවන ප්‍රගමන දෘෂ්ටිකෝණය ඔස්සේ, අන්තර්-ආංශික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සහ වියපත් වීම පුළුල් ජාතික සංවර්ධන සැලසුම්කරණයට ඒකාබද්ධ කිරීම.

8. **සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සවිමත් කිරීම සහ වගවීම**

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, බලපෑම තක්සේරු කිරීම සහ විනිවිදභාවය, තිරසාරභාවය සහ අඛණ්ඩතාවය වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා අධීක්ෂණය, ඇගයීම, දත්ත රැස් කිරීම සහ පර්යේෂණ සඳහා ශක්තිමත් යාන්ත්‍රණ ස්ථාපිත කිරීම.

# 6.0 ප්‍රධාන ප්‍රතිපත්ති ක්ෂේත්‍ර

## 6.1 වැඩිහිටි අයිතිවාසිකම් සහ සුරක්ෂිතතාව

ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන්ගේ අභිමානය, ස්වාධිකාරය සහ සුරක්ෂිතතාව සමාජය තුළ ආරක්ෂා වන පරිදි, ඔවුනගේ අයිතීන් සහ නිදහස පූර්ණ වශයෙන් සුරකෙන බව සහතික කළ යුතු ය. ඔවුනගේ පොදු ජීවිතයේ දී සහ පෞද්ගලික ජීවිතයේ දී, කවර ආකාරයක හෝ අපයෝජන, ප්‍රචණ්ඩතා, වෙනස් කොට සැලකීම්, නො සලකා හැරීම් සහ අවමන් සහගත ලෙස සැලකීම් යනාදී අවස්ථාවලින් රැක ගැනීම ද මීට ඇතුළත් වේ. මෙහිදී, වැඩිහිටි කාන්තාවන් සහ ආබාධ සහිත වැඩිහිටි තැනැත්තන් යනාදී අනාරක්ෂිත කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

***ප්‍රධාන උපාය මාර්ගික මඟ පෙන්වීම්***

- **නෛතික රාමුව**

  වැඩිහිටි තැනැත්තන්, ඔවුන් ඉතා අනාරක්ෂිත විය හැකි අවස්ථාවේ දී ඔවුනගේ අභිමානය සහ සුරක්ෂාව සහතික කෙරෙන නෛතික ආවරණ ශක්තිමත් කිරීමෙහිලා අදාළ නීති හඳුන්වා දීම සහ සංශෝධනය සිදු කිරීම. වැඩිහිටි තැනැත්තන් අපයෝජනයෙන්, නො සලකා හැරීමෙන්, ප්‍රචණ්ඩත්වයෙන් සහ සූරාකෑමෙන් ආරක්ෂා කිරීම සඳහා දැඩි නීති රෙගුලාසි ක්‍රියාත්මක කෙරෙන ආකාරයේ ක්‍රියා පිළිවෙත් දියුණු කිරීම. ඉදිරියේ දී මතුවිය හැකි, තාක්ෂණය ආශ්‍රිත ප්‍රචණ්ඩ ක්‍රියා, මාර්ගගත පරිගණක වංචා, පරිගණක ආශ්‍රිත අඩන්තේට්ටම් සහ මූල්‍ය සූරාකෑම් යනාදී අයථා ක්‍රියා ද මීට ඇතුළත් වේ.

  වැඩිහිටි තැනැත්තන්ගේ වත්කම් රැක ගැනීමේ නීති බලගැන්වීම සහ දැඩිව ක්‍රියාත්මක කිරීම.

  වැඩිහිටි තැනැත්තන් ඉලක්ක කරමින් සිදු කරන අපරාධ ඵලදායි ලෙස විමර්ශනය කොට, නඩු පවරා දඬුවම් කිරීම සඳහා නිශ්චිත වශයෙන් ක්‍රියා පිළිවෙත් සහ උපදෙස් මාලා හඳුන්වා දීම.

- **සමාජ සංස්කෘතික සංවේදීතාව වර්ධනය**

  සමාජ සංස්කෘතික සංවේදීතාව වර්ධනය, වැඩිහිටි තැනැත්තන්ගේ සහභාගිත්වයට ගරු කිරීම, වැඩිහිටි අපයෝජයෙන් තොර වීම, වියපත් වීම හේතුකොට ගෙන අගතිගාමීව සැලකීම සහ වැඩිහිටි තැනැත්තන් පිළිබඳ සමාජයේ පවතින දුර්මතවලට එරෙහිව ක්‍රියාකාරී ව කටයුතු කිරීම.

- **සේවා සැපයීමේ සාධාරණත්වය**

  ප්‍රජා විද්‍යාත්මක සහ සමාජ ආර්ථික තත්ත්වය හෝ පදිංචි ප්‍රදේශය නො සලකා, වැඩිහිටි තැනැත්තන්ගේ ආරක්ෂාව සහ සහාය සේවා සඳහා සාධාරණ ප්‍රවේශ අවස්ථා සැපයීම පිළිබඳ සහතික වීම.

- **නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම**

  වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳ නීති රෙගුලාසි ඵලදායි ලෙසින් සුරැකෙන පරිදි, වැඩිහිටි තැනැත්තන් සම්බන්ධ ප්‍රජාව සහ සේවා සපයන්නන් දැනුවත් කිරීම, උපදේශනය සහ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණ පිළිබඳ තත්ත්වයන් ප්‍රවර්ධනය කිරීම.

- **රජයේ ප්‍රතිපත්ති සැකසීම**

  ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී සහ නව ප්‍රතිපත්ති හඳුන්වා දීමේ දී, වැඩිහිටි තැනැත්තන්ගේ සෞඛ්‍යය, සමාජ රැකවරණය සහ ආරක්ෂණය කෙරෙහි රජයේ අවධානය යොමු කිරීම.

## 6.2 සෞඛ්‍යය සහ යහපැවැත්ම

වැඩිහිටි තැනැත්තන්ගේ ජීවිතයේ ගුණාත්මකභාවය, ස්වාධීනත්වය සහ සමාජයේ ක්‍රියාකාරී සහභාගීත්වය පවත්වාගෙන යෑම උදෙසා, ඔවුනගේ සෞඛ්‍යය සහ යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා වැඩිහිටි තැනැත්තන්ගේ විවිධ වූ ශාරීරික, මානසික සහ සමාජීය අවශ්‍යතාවලට සරිලන සේ සැකසූ සහනදායී සහ අංග සම්පූර්ණ සෞඛ්‍ය සේවා පැවතිය යුතු ය. මෙහි දී, නිදන්ගත රෝග වැළැක් වීම සහ කළමනාකරණය, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය, ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ ව දැනුවත් කිරීම මෙන් ම සහකම්පනයෙන් යුතු උපස්ථායක සහාය සැපයීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

***ප්‍රධාන උපාය මාර්ගික මඟ පෙන්වීම්***

- **සෞඛ්‍ය සේවා ප්‍රවේශය සහ ගුණාත්මකභාවය**

  ප්‍රතිකාර, නිවාරණ, පුනරුත්ථාපන, සහන සේවා සහ දිවිනිමා සත්කාර සේවා යනාදී සෑම මට්ටමක දී ම වැඩිහිටි තැනැත්තන් හට අංග සම්පූර්ණ සෞඛ්‍ය සේවා ලබා ගැනීමට සාධාරණ අවස්ථා පවතින බව සහතික වීම. ගුණාත්මක වැඩිහිටි හිතකාමී සේවාවක් සැපයීම උදෙසා, ප්‍රාථමික සෞඛ්‍ය සේවා සහ දිගුකාලීන සත්කාර සේවා ශක්තිමත් කිරීම. සත්කාර සේවා ප්‍රමිතිගත ඇගයුම් ක්‍රම බහු ශික්ෂණ කණ්ඩායම්, පුනරුත්ථාපන සේවා, උපදේශන සේවා, මහජන දැනුවත් කිරීම් සහ පවුල්/ප්‍රජා පාදක සත්කාර ඔස්සේ අන්තර් කාලීන සත්කාර සේවා සැපයීම් ප්‍රවර්ධනය කිරීම.

- **සෞඛ්‍ය සම්පන්න වියපත්වීම ආශ්‍රිත වැඩසටහන්**

  සියලු තැනැත්තන් හට සිය ජීවිත කාලය මුළුල්ලේ ම සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් සහ මානසික යහ පැවැත්මක් පවත්වා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා උපදේශන, දැනුවත් කිරීම සහ ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. වයස්ගත වීම ආශ්‍රිත සෞඛ්‍යමය අභියෝගවලින් පැන නගින දුෂ්කරතා අඩු කිරීම සඳහා ක්‍රියාකාරී වියපත් භාවය දිරිමත් කිරීම.

- **රෝග වළක්වා ගැනීම සහ කළමනාකරණය**

  ප්‍රමාණවත් එන්නත්කරණ වැඩසටහන් සහ ප්‍රජාපාදක මැදිහත් වීම් ඔස්සේ, වැඩිහිටි තැනැත්තන්ට බලපාන බෝ වන සහ බෝ නො වන රෝග නිවාරණය, නිසි කලට ප්‍රතිකාර සැපයීම සහ පුනරුත්ථාපනය කෙරෙහි ප්‍රමුඛතාව ලබා දීම.

- **තාක්ෂණය සහ නවෝත්පාදනය**

  වැඩිහිටි තැනැත්තන් සඳහා වන සේවා සැපයුම් සඳහා ප්‍රවේශ වීමේ හැකියාව, කාර්යක්ෂමතාව සහ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා දුරස්ථ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම, කෘත්‍රිම බුද්ධිය සහ අනෙකුත් නව්‍ය තාක්ෂණික ක්‍රම උපයෝගි කර ගැනීම.

- **ප්‍රතිකාර ප්‍රවේශ්‍යතාව**

  බටහිර වෛද්‍ය විද්‍යාව මෙන් ම සම්ප්‍රදායික අනුපූරක ප්‍රතිකාර ක්‍රම ඇතුළු ව රටේ සියලුම අනුමත බහුවිධ වෛද්‍ය සේවා ප්‍රතිකාර ක්‍රමවලින් ඕනෑම ක්‍රමයක් සහනදායී, කාලෝචිත හා සාධාරණ අවස්ථා සහිතව රෝග පරීක්ෂාව, ප්‍රතිකාර සහ චිකිත්සාව සහතික කිරීම.

## 6.3 මූල්‍ය සුරක්ෂිතතාව

වැඩිහිටි තැනැත්තන් හට අභිමානයෙන්, ස්වාධීන ව සහ සුරක්ෂිත ව ජීවත් වීම උදෙසා ආර්ථික ස්ථාවරත්වය අත්‍යවශ්‍ය වේ. මේ අවශ්‍යතා අතර සවිමත් විශ්‍රාම වැටුප් ක්‍රම, අඛණ්ඩ ආර්ථික සහභාගීත්වය සඳහා අවස්ථා මෙන් ම, අනාරක්ෂිත වැඩිහිටි තැනැත්තන් සඳහා ඉලක්කගත මූල්‍ය සහාය සැපයීම ද අවශ්‍ය වේ.

*ප්‍රධාන උපාය මාර්ගික මඟ පෙන්වීම්*

- **විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ**

  වැඩිහිටි තැනැත්තන් අතර පවතින ආදායම් විෂමතාව අඩුකිරීමේ අරමුණින් සංශෝධන සහ නව්‍ය ආකෘති තුළින් සැමට සාධාරණ විශ්‍රාම වැටුප් ආවරණ ක්‍රමයක් තිරසර සහ ප්‍රමාණවත් අයුරින් ලබා දීම සහතික කිරීම.

- **රැකියා සහ ජීවනෝපාය සහාය**

  වැඩිහිටි තැනැත්තන් විසින් නිපදවන භාණ්ඩවලට වෙළෙඳ පොළ අවස්ථා සම්පාදනය ඇතුළු ව, ඔවුනට අඛණ්ඩ ව ආර්ථිකයෙහි යෙදී සිටීම පහසු කරවන අයුරින්, නම්‍යශීලී සේවා කාලයක්, අර්ධකාලීන රැකියා අවස්ථා සහ කුසලතා සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

- **මූල්‍ය දිරිගැන්වීම්**

  ආර්ථික සුරක්ෂිතතාව වර්ධනයෙහිලා බදු සහන, ඉතිරි කිරීම් සඳහා ඉහළ පොලී අනුපාත, ජීවනෝපාය ඇරඹීම සඳහා ණය පහසුකම්, අඩු ආදායම්ලාභී වැඩිහිටි තැනැත්තන්ට මූල්‍යාධාර සහ රක්ෂණ යෝජනා ක්‍රම සඳහා ප්‍රවේශ වීම් යනාදී අවස්ථා සපයමින් ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රමුඛතා මූල්‍යමය ප්‍රතිලාභ සැපයීම.

- **මූල්‍ය සාක්ෂරතාව**

  ඵලදායි මූල්‍ය කළමනාකරණය සඳහා ඉතිරි කිරීම්, ආදායම් සහ වියදම් කළමනාකරණය, වියදම් කිරීම පිළිබඳ ප්‍රමුඛතා සහ ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳ තොරතුරු සැපයීම.

## 6.4 සමාජ ආරක්ෂණය, සහභාගීත්වය සහ අන්තර්කරණය

වැඩිහිටි තැනැත්තන්ගේ ජීවිතයේ ගුණාත්මකභාවය, මානසික යහපැවැත්ම සහ ප්‍රජා ඒකාබද්ධතාව වැඩිදියුණු කිරීම සඳහා සමාජ අන්තර්කරණය සහ ක්‍රියාකාරී සහභාගීත්වය අත්‍යාවශ්‍ය වේ.

වැඩිහිටි තැනැත්තන්ට සමාජීය, සංස්කෘතික සහ සිවිල් ජීවිතයට සම්පූර්ණයෙන් ම සහභාගී විය හැකි පරිසර ප්‍රතිපත්ති මගින් සකස් කළ යුතු අතර, හුදකලාව බව අඩු කර අයිතිවාසිකම් පිළිබඳ හැඟීමක් ප්‍රවර්ධනය කළ යුතු ය. යාවජීව අධ්‍යාපනය සහ සහායක සේවාවන් සඳහා ප්‍රවේශය ඔවුනගේ ස්වාධිකාරය සහ සමාජයට අඛණ්ඩ දායකත්වයක් ලබා දීම සඳහා වැදගත් වේ.

*ප්‍රධාන උපාය මාර්ගික මඟපෙන්වීම්*

- **වැඩිහිටි තැනැත්තන්ගේ භූමිකා හා වගකීම්**

  සමාජ ඒකාබද්ධතාව, ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ සමාජය තුළ ඇගැයීමට ලක්වන ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස රැඳී සිටීම සඳහා සිය දැනුම සහ අත්දැකීම් බෙදා ගනිමින්, සමාජ හා ස්වේච්ඡා සහභාගිත්වය සපයමින්, අන්තර් පරම්පරානුගත සහයෝගීතාව සඳහා සහය වෙමින්, පවුල, ප්‍රජාව සහ සමස්ත සමාජය වෙත ක්‍රියාකාරී දායකත්වය සැපයීම දිරිමත් කිරීම.

- **ප්‍රජා පාදක වැඩසටහන්**

  වැඩිහිටි තැනැත්තන් අතර සමාජ සහභාගිත්වය දිරිමත් කිරීමට, ස්වේච්ඡා සේවය සහ සම-වයස් කණ්ඩායම් වෙත සහාය සැපයීම දිරිගන්වන සුළු වැඩසටහන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම. මෙම ප්‍රයත්තයන් තුළින් සමාජ හුදකලා බව අඩු වීම, සහයෝගී සම්බන්ධතා සඳහා උපකාර වීම, ජාල ගොඩ නැගීම සහ ප්‍රජාවන් අතර අන්තර් පරම්පරා සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා උපකාරී වීම.

- **අන්තර් පාරම්පරික සබඳතා**

  තරුණ සහ වැඩිහිටි පරම්පරා අතර අන්‍යෝන්‍ය ගරුත්වය, අවබෝධය සහ සහයෝගය වඩවන සුළු ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්තිවලට සහාය ලබා දී ඒවා ප්‍රවර්ධනය කිරීම. එවැනි වැඩසටහන් මගින්, ධනාත්මක ආකල්ප සහ චර්යාවන් වැඩිදියුණු කිරීම සඳහා ජීවන ප්‍රගමන ප්‍රවේශ යොදා ගනිමින්, පරම්පරා අතර පරතරය යා කිරීමටත්, පවුල් සහ ප්‍රජා සබඳතා ස්ථාපිත කිරීමටත් උදව් දීම.

- **ප්‍රජා සහභාගීත්ව යටිතල පහසුකම්**

  සමාජීය අන්තර් සබඳතා සහ සහාය සැපයෙන අත්‍යාවශ්‍ය අවකාශ වශයෙන් සැලකෙන දිවා මධ්‍යස්ථාන, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටු පිහිටුවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ආයෝජන සිදු කිරීම. මෙම පහසුකම් සහ වැඩසටහන් සාධාරණ ප්‍රවේශයකින් කළමනාකරණය කරන බවට සහ විවිධ වැඩිහිටි අවශ්‍යතා සපුරාලීම සඳහා නිතිපතා අධීක්ෂණය කර ඇගයීමට වග බලා ගැනීම.

- **යාවජීව අධ්‍යාපනය**

  වැඩිහිටි තැනැත්තන්ට විධිමත් හා අවිධිමත් අධ්‍යාපන කටයුතුවල යෙදීම, විනෝදාත්මක ක්‍රියාකාරකම් සහ කුසලතා සංවර්ධනය සඳහා අවස්ථා පුළුල් කිරීම. නවීන ලෝකය තුළ සැරිසැරීමට උපකාර කිරීම සඳහා ඩිජිටල් සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම මෙන් ම විවෘත විශ්ව විද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතන වෙත ප්‍රවේශ වීමට සහාය වීම මෙයට ඇතුළත් වේ.

- **සමාජ සහායක සේවා**

  උදව් අවශ්‍ය කරන වැඩිහිටි තැනැත්තන් හට සහාය සැපයෙන සත්කාරක සේවා සහාය වැඩසටහන් සහ නිවාසවලට පැමිණ සහාය සපයන සේවාවන්ට පහසුවෙන් යොමු විය හැකි, සහායක සේවා ගොඩනගා පවත්වා ගෙන යෑම. නිදහස් ජීවිතයක් සහ යහ පැවැත්මක් ගෙන යෑමට සහාය සපයන සහනශීලී සමාජ සේවා සහ සමාජ ආරක්ෂණ සේවා සපයා ගැනීමට සුදුසු උපාංග සහ තාක්ෂණය සැමට ලබා ගත හැකි බව සහතික වීම.

## 6.5 දිගුකාලීන සත්කාර සහ සහායක සේවා

දෛනික ජීවන ක්‍රියාකාරකම් අඛණ්ඩ ව අවශ්‍ය කරන වැඩිහිටි තැනැත්තන්ගේ බහුවිධ අවශ්‍යතා සපුරාලීමට පැවතිය යුතු තීරණාත්මක අවශ්‍යතාවක් වන්නේ අංග සම්පූර්ණ වූත්, ගුණාත්මක වූත් දිගු කාලීන සත්කාර සේවා පවත්වා ගැනීමයි. වැඩිහිටි තැනැත්තන් හට සුරක්ෂිත හා අභිමානය රැකෙන පරිසරයක් තුළ නිසි සහයක් ලබාගත හැකි අයුරින් සැකසූ, නිවාස පාදක උපස්ථාන සේවා සිට ආයතන ගත පහසුකම් දක්වා අඛණ්ඩ සේවාවන් මීට ඇතුළත් වේ.

***ප්‍රධාන උපාය මාර්ගික මඟපෙන්වීම්***

- **දිගු කාලීන සත්කාර සේවා**

  නේවාසික සත්කාර ආයතන, ප්‍රජා පාදක සත්කාර සහ නිවාස සත්කාර සපයන්නන් ඇතුළු සියලුම වැඩිහිටි සත්කාර සේවා සඳහා ශක්තිමත් ලියාපදිංචි පද්ධති, මාර්ගෝපදේශ සහ ගුණාත්මක ප්‍රමිතීන් සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම. මෙකී සියලු පද්ධති හරහා ස්ථාවර, ආරක්ෂිත, සහකම්පනයෙන් යුතු සහ පුද්ගල කේන්ද්‍රීය සත්කාර සේවාවන් සහතික කෙරෙනු ඇත.

  රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ දිගු කාලීන සත්කාර සේවා, වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මඟ පෙන්වීම් හා උපදෙස් අනුව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය කර නියාමනය කෙරෙනු ඇත.

- **සත්කාරක සේවා සපයන්නන්ගේ ධාරිතා වර්ධනය සහ අවශ්‍ය සහාය සැපයීම**

  කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පුහුණු වීම් අවස්ථා සපයමින් පුහුණු සත්කාරක සේවා සපයන්නන්ගේ හිඟය මඟ හැර වීම. වෘත්තීය උසස් සත්කාර සපයන්නන් සහ පවුලේ සාමාජිකයින් යන දෙපාර්ශවයේ ම කුසලතා වඩවන ප්‍රතීතන පුහුණු වැඩසටහන් පිහිටු වීම. විඩාපත් වීම වළක්වා සත්කාර සේවාවන්හි ප්‍රතිඵල වැඩිදියුණු කර ගැනීම උදෙසා, සත්කාරක සේවාවන්හි නිරතවන්නන්ට මූල්‍ය සහය, කෙටි කාලීන විවේකය සහ චිත්තවේගීය සහය ලබා දීම. පවත්නා පුහුණු මධ්‍යස්ථානවල ප්‍රමිතිය පවත්වා ගෙන යෑම සහ වැඩිවන ඉල්ලුමට සරිලන ධාරිතා වර්ධනය සඳහා අඛණ්ඩ ව අධීක්ෂණය සහ ඇගයුම.

- **දිගු කාලීන සත්කාර සේවා ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ නියාමනය**

  දිගු කාලීන සත්කාර සේවා සපයන්නන් ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් නිතිපතා ඇගයුමට ලක් කිරීම. අනාගත ශ්‍රමික අවශ්‍යතා පුරෝකථනය කරමින් පුහුණු සත්කාරක සේවා සපයන්නන් බඳවා ගැනීමේ සහ රඳවා ගැනීමේ ක්‍රමෝපායන් ශක්තිමත් කිරීම.

- **දිගු කාලීන සත්කාර සඳහා සහන දායී සහ සාධාරණ ප්‍රවේශය**

  අඩු ආදායම්ලාභී සහ අවදානම් සහගත වැඩිහිටි තැනැත්තන් සඳහා දිගු කාලීන සත්කාර පැකේජ ඇති කිරීම සහ දිගු කාලීන රක්ෂණ ක්‍රම සපයා දීම. සියලුම වැඩිහිටියන් සඳහා නිවාස පාදක සත්කාර සේවා වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික ක්‍රමෝපායන් සකස් කිරීම.

## 6.6 වැඩිහිටි හිතකාමී පරිසර

වැඩිහිටි තැනැත්තන්ට සුරක්ෂිතතාව, ස්වාධීනත්වය සහ ක්‍රියාකාරී සහභාගිත්වය කෙරෙහි සහාය වන පරිසර නිර්මාණය කිරීම ඔවුනගේ යහ පැවැත්ම සහ ජීවිත ගුණාත්මකභාවය පවත්වා ගෙන යැමට මූලික වේ. වැඩිහිටි තැනැත්තන්ට සිය ප්‍රජාව තුළම සුවපහසු ලෙස ජීවත්වීම සඳහා අවශ්‍ය ශාරීරික, සමාජීය සහ සේවා ආශ්‍රිත කරුණු සලකා බැලීම මෙහි අරමුණ වේ.

*ප්‍රධාන උපාය මාර්ගික මඟ පෙන්වීම්*

- **ප්‍රවේශ විය හැකි ජීවන අවකාශ**

  වැඩිහිටි තැනැත්තන්ට ස්වාධීන ව, අභිමානයෙන් යුතු ව ජීවත් වීමේ ඉඩකඩ පවතින, සහනදායි ආරක්ෂිත සහ ප්‍රවේශ විය හැකි ආකාරයේ වැඩිහිටි හිතකාමී සැලසුම් නිර්මාණ ආකෘති සහිත නිවාස හඳුන්වා දීම.

- **නේවාසික සත්කාර රෙගුලාසි**

  ආරක්ෂිත, මානුෂීය සහ ප්‍රතිචාරාත්මක සත්කාර පරිසරයන් සහතික කිරීම උදෙසා නේවාසික සත්කාර සහ සාත්තු නිවාස ඇතුළු දිගු කාලීන සත්කාර පහසුකම් සඳහා ගුණාත්මක ප්‍රමිතීන් සහ රෙගුලාසි පිළියෙළ කර බලාත්මක කිරීම.

- **පොදු යටිතල පහසුකම් සහ ප්‍රවාහනය**

  පොදු අවකාශ, ප්‍රවාහන පද්ධති, පදික වේදිකා, උද්‍යාන සහ නාගරික යටිතල පහසුකම්වල ප්‍රවේශ්‍යතාව, ආරක්ෂාව සහ අන්තර්කරණය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම. වැඩිහිටි තැනැත්තන් සඳහා සංචලනය සහ සමාජ සහභාගීත්වය පහසු කිරීම සඳහා වැඩිහිටි හිතකාමී පොදු ප්‍රවාහන විකල්ප වැඩිදියුණු කිරීම, ඔවුනට ඔවුනගේ ප්‍රජාවන් තුළ ආරක්ෂිතව සහ පහසුවෙන් ගමන් කළ හැකි බව සහතික කිරීම.

## 6.7 හදිසි අවස්ථා සූදානම

වැඩිහිටි තැනැත්තන් බොහෝ විට හදිසි අවස්ථා සහ ව්‍යසන වලදී ඉහළ අවදානම්වලට මුහුණ දෙන අතර, සූදානම, ප්‍රතිචාර දැක්වීම සහ සුවය ලැබීමේ සෑම අදියරකදීම ඔවුනගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

*ප්‍රධාන උපාය මාර්ගික මඟ පෙන්වීම්*

- **හදිසි අවස්ථා ප්‍රතිචාර පද්ධති**

  ස්වභාවික සහ මානවකාරක ව්‍යසනයක දී, සමුච්ඡනය නො කරන ලද දත්ත පදනම් කරගෙන ප්‍රථමාධාර සහ කඩිනම් සහාය වැඩිහිටි පුද්ගලයින්ගේ අවශ්‍යතා වෙනුවෙන් ම යොමු වූ ප්‍රමුඛතාවයකින් යුක්තව සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම.

- **අන්තර්කරණය වූ ආපදා සැලසුම්කරණය**

  දේශගුණික විපර්යාස, වසංගත සහ ආර්ථික අර්බුද ආශ්‍රිත අභියෝගවලට පිළිතුරු සෙවීමේ දී ආපදා අවදානම අඩු කෙරෙන සහ අර්බුද කළමනාකරණය සඳහා වන සැලසුම්වල දී, වැඩිහිටි තැනැත්තන්ගේ අවශ්‍යතා සහ අදහස් පුළුල් වශයෙන් අන්තර්ගත කිරීම.

- **විශේෂිත සෞඛ්‍ය සහ සමාජ සේවා**

  ඖෂධ, සංචලන ආධාරක සහ මනෝ සමාජීය සහාය ඇතුළුව හදිසි අවස්ථාවල දී වැඩිහිටි තැනැත්තන් සඳහා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සහ සමාජ ආධාර සේවාවන් සැපයීම සහ එම සේවාවන් අඛණ්ඩ ව පවත්වා ගෙන යාම සහතික කිරීම.

## 6.8 ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි සහ තිරසාර ප්‍රතිඵල සහතික කිරීම වෙනුවෙන් මනා ලෙස සම්බන්ධීකරණය කරන ලද කාර්යයන්, ප්‍රමාණවත් සම්පත් සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම අවශ්‍ය වේ.

*ප්‍රධාන උපායමාර්ගික මඟපෙන්වීම්*

- **අන්තර් ආංශික සම්බන්ධීකරණය**

  වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සඳහා ඒකාබද්ධ හා ඵලදායී ප්‍රවේශයක් සහතික කිරීම වෙනුවෙන් රාජ්‍ය ආයතන, රාජ්‍ය නො වන සංවිධාන, පෞද්ගලික අංශය, ප්‍රජා කණ්ඩායම් අතර සහයෝගීතාවය සහ සන්නිවේදනය ශක්තිමත් කිරීම.

- **ශ්‍රම බලකාය**

  වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා ශ්‍රම බලකාය බලගැන්වීම.

- **රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන්**

  සම්පත් භාවිතය, තාක්ෂණික විශේෂඥතාව සහ සේවා සැපයීම ප්‍රශස්ත කිරීම සඳහා රාජ්‍ය ආයතන සහ පෞද්ගලික කොටස්කරුවන් අතර හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

- **අයවැය සහ සම්පත් යෙදවීම**

  වයස්ගත වීමේ ජීවන සංසිද්ධියට සහාය වීම සඳහා නව්‍ය මූල්‍යකරණ යාන්ත්‍රණයන් ගවේෂණය කරන අතර ම, ප්‍රතිපත්තියේ ප්‍රමුඛතාවලට අනුකූල ව ප්‍රමාණවත් සහ තිරසර අරමුදලක් සම්පාදනය කිරීම.

- **සාක්ෂි මත පදනම් වූ ප්‍රවේශයන්**

  ප්‍රතිපත්ති සංවර්ධනය, වැඩසටහන් සැලසුම් කිරීම සහ අධීක්ෂණය පිළිබඳව දැනුවත් කිරීම සඳහා දත්ත රැස් කිරීමේ පද්ධති වැඩිදියුණු කිරීම, පර්යේෂණ ධාරිතාව ගොඩනැගීම සහ වයස්ගත වීම පිළිබඳ කරුණු ඇතුළත් මධ්‍යගත ජාතික දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම.

## 6.9 අධීක්ෂණය සහ ඇගයීම

වැඩිහිටි තැනැත්තන්ගේ වෙනස් වන අවශ්‍යතා වලට අනුකූලව ප්‍රතිපත්තියේ අදාළත්වය, ඵලදායිතාවය සහ ප්‍රතිචාරාත්මක බව සහතික කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණය සහ ඇගයීම අත්‍යවශ්‍ය වේ.

*ප්‍රධාන උපාය මාර්ගික දිශාවන්*

- **බහු ආංශික අධීක්ෂණය**

  ප්‍රගතිය සහ බලපෑම නිරීක්ෂණය කිරීම සඳහා අදාළ අංශ හරහා පුළුල් අධීක්ෂණ රාමු සහ ප්‍රතිඵල දර්ශක සකස් කිරීම.

- **ස්වාධීන අධීක්ෂණය**

  අඛණ්ඩ ඇගයීම් සහ වගවීම සහතික කිරීම සඳහා දේශපාලන නායකත්වයේ සහාය ඇති ව ස්වාධීන ආයතනයක් ස්ථාපිත කිරීම.

- **කාලානුරූපී සමාලෝචන**

  ප්‍රතිපත්ති ගැලපීම් සහ වැඩිදියුණු කිරීම් පිළිබඳ ව අඩුපාඩු හඳුනා ගැනීමට සහ ප්‍රතිපත්ති සංශෝධන දැනුම් දීමට ක්‍රමානුකූල සහ කාලෝචිත තක්සේරු කිරීම් සිදු කිරීම.

## 6.10 උපදේශනය, දැනුවත් කිරීම සහ සන්නිවේදනය

වියපත් වීම පිළිබඳ සමාජීය අවබෝධය සහ ධනාත්මක ආකල්ප වැඩිහිටි තැනැත්තන්ගේ අන්තර්කරණය සහ යහපැවැත්ම කෙරෙහි සහාය වේ.

*ප්‍රධාන උපාය මාර්ගික දිශාවන්*

- **මහජන දැනුවත් කිරීමේ ප්‍රචාරක ව්‍යාපාර**

  වැඩිහිටි ගරුත්වය ප්‍රවර්ධනය කිරීම, වියපත් වීම හේතුකොට ගෙන අගතීගාමීව සැලකීමට එරෙහිව අභියෝග කිරීම, වියපත්භාවය සහ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ නිවැරදි තොරතුරු සැපයීම සඳහා වැඩසටහන් දියත් කිරීම.

- **ප්‍රජා සහභාගීත්වය**

  වැඩිහිටි තැනැත්තන්ට උපදේශන සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීව සහභාගී වීම සඳහා සවිබල ගැන්වීම.

- **මාධ්‍ය සහ සන්නිවේදනය**

  වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම්, ලබා ගත හැකි සේවාවන් සහ සෞඛ්‍ය සම්පන්න වියපත් වීමේ පිළිවෙත් පිළිබඳ තොරතුරු ප්‍රචාරනය කිරීම සඳහා විවිධ මාධ්‍ය අවකාශ භාවිතා කිරීම.

- **ධාරිතා ප්‍රවර්ධනය**

  සේවා සපයන්නන්, ප්‍රජා නායකයින් සහ කොටස්කරුවන් සඳහා වියපත් වීම ආශ්‍රිත ගැටළු සහ අන්තර්කරණ පිළිවෙත් පිළිබඳ ව පුහුණුව ලබා දීම.